# <u>නිෂ්පාදන ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීම.</u>

"නිපදවන භාණ්ඩ හා සේවා ආශ්‍රයෙන්ම නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කිරීම" මෙහිදී සිදුවේ.

## <u>නිෂ්පාදන ඉම</u>

- ජාතික ගිණුම් සැකසීමේ දී දළ දේශීය දේශීය නිෂ්පාදනයට ඇතුළත් කරන නිෂ්පාදන කටයුතු හා ඇතුළත් නොකරන නිෂ්පාදන කටයුතු අතර සීමාව නිෂ්පාදන ඉම ලෙස හැඳින්වේ.
- ජාතික ගිණුම්කරණයේදී නිෂ්පාදන ඉමට ඇතුළත් වන ආර්ථික ක්‍රියාකාරකම් ලෙස සැලකෙන පහත දෑ "නිෂ්පාදන ක්‍රියාකාරකම්" ලෙස හඳුනා ගනියි.
    - නිෂ්පාදනය කළ ආයතන හැර, සෙසු ආයතන ඒකක සඳහා නිෂ්පාදනය කළ සියලුම භාණ්ඩ හා සේවාවන්.
    - වැටුප් හෝ වෙනත් ආකාරයේ ගෙවීමක් වෙනුවෙන් වැයකළ ශ්‍රමය.
    - ස්වපරිභෝජනය සඳහා නිෂ්පාදනය කළ භාණ්ඩ.
    - තමාගේ නිවසින් ලබා දෙන්නා වූ නේවාසික සේවාව.
    - ශ්‍රමය ස්වේච්ඡා භාවිතයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවා.
    - ගෘහ ඒකක තුළ සිදුවන පහත සඳහන් ක්‍රියාකාරකම්,
        - තමන්ම පදිංචි වී සිටින නිවාසවලින් සැපයෙන සේවාවන්, වැටුප් ලබන ගෘහ සේවකයන් විසින් ඉටු කරනු ලබන සේවාවන්.
        - රෙදි විවීම, ඇඳුම් මසා ගැනීම, ගොතන ලද ඇඳුම් සහ තොප්පි, ගෘහ භාණ්ඩ තනා ගැනීම.
        - ජලය සපයා ගැනීම (කුඩා ඇළවල්, දිය ඇලි මගින් ජලය සපයා ගැනීමට කුඩා ව්‍යාපෘති).
        - කෘෂි නිෂ්පාදන සැකසීම, මසුන් අල්ලා ගැනීම, වී කොටා සකස් කිරීම, මාළු කල් තබා ගැනීම සඳහා පිළියෙල කිරීම, පළතුරු බෝතල් කිරීම, කිරි මුදවා ගැනීම.

## නිෂ්පාදන ඉමට ඇතුලත් නොවන දෑ

මේවා නිෂ්පාදන ඉමට ඇතුළත් නොවන අතර ජාතික ආදායම් ගිණුම් වලින්ද බැහැර කෙරේ.

1. **නිෂ්පාදන ඉමට ඇතුළත් නොවන ඵලදායි කටයුතු**
    - ගෘහ ඒකක වල සිදුවන සේවා
        - ගෙවතු අලංකරණය
        - දරුවන් රැකබලා ගැනීම
        - ආහාර පිළියෙල කිරීම හා පිළිගැන්වීම

    - ආයතනයක හෝ පුද්ගලයෙකුගේ මැදිහත්වීමකින් තොරව සිදුවන ස්වභාවික ක්‍රියාකාරකම්
        - විවෘත ජලාශයක මත්ස්‍ය ගහනය වැඩිවීම

    - නිරීක්ෂණය නොවන ආර්ථික කටයුතු
        - නීති විරෝධි ආර්ථික කටයුතු
        - සැගවුණු නිෂ්පාදන කටයුතු

2. **නිෂ්පාදන ඉමට ඇතුළත් නොවන ඵලදායි නොවන කටයුතු**
    - සංක්‍රාම
    - මුදල්මය පත්‍රිකා ආශ්‍රිත ගනුදෙනු
    - පාවිච්චි කළ භාණ්ඩ විකිණීම ආශ්‍රිත ගනුදෙනු

🕮 **නිෂ්පාදන ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම් තක්සේරු කිරීම සඳහා විවිධ මිල ගණන් පවතී.**

**1.මූලික මිල**

නිෂ්පාදකයා තම භාණ්ඩය හෝ සේවාව හෝ නිෂ්පාදනය කොට අලෙවි කිරීමට සූදානම් කොට ඇති අවස්ථාවක දී එම භාණ්ඩය හෝ සේවාව සඳහා අදාළ මිල වේ.

| මූලික මිල = නිෂ්පාදකයන්ගේ මිල − නිෂ්පාදිතය මත පනවන ශුද්ධ බදු |
|---|

**2.නිෂ්පාදකයාගේ මිල**

නිෂ්පාදන ස්ථානයෙන් වෙළෙඳුන් කරා භාණ්ඩය ඉවතට යන විට නිෂ්පාදකයා විසින් අය කර ගනු ලබන මිලය.

| නිෂ්පාදකයාගේ මිල = මූලික මිල + නිෂ්පාදිතය මත ශුද්ධ බදු |
|---|

**3.ගැණුම්කරුවන්ගේ මිල**

පාරිභෝගිකයා සත්‍ය වශයෙන්ම භාණ්ඩ හා සේවා සඳහා ගෙවන මිල වේ.

| | | |
|---|---|---|
| ගැනුම්කරුවන්ගේ මිල | = | නිෂ්පාදකයන්ගේ මිල + වෙළෙඳ තීරුව + පාරිභෝගිකයා ගෙවන ප්‍රවාහන ගාස්තු + පාරිභෝගික භාණ්ඩ මත ශුද්ධ බදු |

**නව ක්‍රමවේදයට අනුව ජාතික ගිණුම් සැකසීමේ දී දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනුයේ වෙළඳපොල මිල යටතේ පමණි.**

වෙළඳපළ මිල = මූලික මිල + ශුද්ධ වක්‍ර බදු

## නිමැවුම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීම.

මේ යටතේ ආකෘති දෙකකි.

1. කර්මාන්ත මූලය
2. ආයතනික අංශය

| **කර්මාන්ත මූලය අනුව** | **ආයතනික අංශය අනුව** |
|---|---|
| කෘෂි අංශයේ දළ එකතු කළ අගය<br>කාර්මික අංශයේ දළ එකතු කළ අගය<br>+ සේවා අංශයේ දළ එකතු කළ අගය | මූල්‍ය නොවන අංශයේ ආයතන<br>මූල්‍ය අංශයේ ආයතන<br>රාජ්‍ය අංශයේ ආයතන<br>ගෘහ ඒකක අංශයේ ආයතන<br>+ ලාභ අරමුණකින් තොරව ගෘහ ඒකකවලට සේවා සපයන ආයතන |
| මූලික මිලට සමස්ත දළ එකතු කළ අගය<br>+ ශුද්ධ වක්‍ර බදු | මූලික මිලට සමස්ත දළ එකතු කළ අගය<br>+ ශුද්ධ වක්‍ර බදු |
| **වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදනය** | **වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදනය** |

**අභ්‍යාසය**

1. පහත සඳහන් විවිධ ක්‍රියාකාරකම් දළ දේශීය නිෂ්පාදිතය ගණනය සඳහා ඇතුලත් වේ ද නැද්ද යන්න සඳහන් කරන්න.

   I. මහපොල ශිෂ්‍යාධාර
   II. මෙහෙකරුවන් විසින් සිදුකරන ගෘහාශ්‍රිත සේවා
   III. තමාගෙම නිවසින් ලබා දෙන්නා වූ නේවාසික සේවය
   IV. සුපිරි වෙළෙඳසැලක විකිණීමට ඇති භාණ්ඩ
   V. රත්රන් මිල ඉහළ යාම
   VI. තම නිවසේ මොටර් රථයෙන් දරුවා පාසල් රැගෙන යාම

2. පහත තොරතුරු ආශ්‍රයෙන් දළ දේශීය නිෂ්පාදිතය වෙළඳ මිලට ගණනය කරන්න.

| | (රු.මිලියන) |
|---|---|
| කෘෂිකාර්මික කටයුතුවල එකතුකළ අගය | 8000 |
| කාර්මික කටයුතුවල එකතුකළ අගය | 16000 |
| සේවා කටයුතුවල එකතුකළ අගය | 24000 |
| භාණ්ඩ හා සේවා මත ශුද්ධ වක්‍ර බදු | 2000 |